# අලුත් අවුරුද්ද

අවුරුද්ද සිංහල අවුරුද්ද බවටත් ජනවාරි පළමුවැනිදා අවුරුද්ද බවටත් පත්කරනු ලැබුයේ ඉංගිරිසින් විසින් බව පැහැදිලි ය. එහෙත් ඒ සඳහා ඔවුනට අවුරුදු එකසිය පණහකටත් වැඩි කාලයක් ගතවිය. අප කුඩා කල ද ජනවාරි පළමුවැනි දා හඳුන්වනු ලැබුයේ ජනේරුව ලෙස ය. අලුත් අවුරුද්ද උදාවුයේ බක් මහේ දී ය. එහෙත් මේ වන විට අනෙක් බොහෝ කරුණුවල දී මෙන් ම අවුරුද්ද සම්බන්ධයෙන් ද අපට ඇත්තේ කණපිට ය. එදා අවුරුද්ද අද සිංහල අවුරුද්දෙන්වත් නොනැවතී ඊනියා සිංහල දෙමළ අවුරුද්දක් බවට පත්වෙමින් ඇත. එදා ජනේරුව අද අවුරුද්ද බවට පත් වී ඇත. එදා වෙද මහතා අද සිංහල වෙද මහතා හෝ ආයුරවේ ද ඩොක්ටර (සිංහල වෙදකම ආයුර්වේදය නොවුණ ද) හෝ බවටත් එදා ඉංගිරිසි බෙහෙත් අද බෙහෙත් බවටත් පත් වී ඇත්තේ එලෙසින් ය. අද ඉංගිරිසි (බටහිර) දේ සාමාන්‍යය බවටත් සිංහල දේ විශේෂ්‍යය බවටත් පත් වී ඇත.

එහෙත් අනෙක් තැන්වල දීට ද වඩා අවුරුද්දේ දී සිංහල අවුරුද්ද ද නැති වී සිංහල දෙමළ අවුරුද්දක් බවට ඒ පත්කිරීමට දැඩි උත්සාහයක් වෙයි. මෙය ද ඉංගිරිසින්ගේ වැඩ පිලිවෙළක් වෙයි. ඔවුහු අවුරුද්ද සිංහල හා හින්දු අවුරුද්ද ලෙස නම් කළහ. එහෙත් බක් මහේ හින්දු හෝ දෙමළ හෝ අවුරුද්දක්  නැත. මේ සිංහලයන්ට අවසානයේ දී තම අවුරුද්ද ද නැතිකිරීමට ගන්නා උත්සාහයක් පමණකි. අද මෙරට දෙමළ ජනයා අවුරුදු උත්සවය පැවැත්වීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැත. මෙරට මුස්ලිම් ආදී ජනවර්ග ද අවුරුද්ද බක් මහේ දී පවත්වන්නේ නම් අපි සතුටු වෙමු. එය මෙරට ජාතික උත්සවය විය යුතු ය යන්න අපේ ද බලාපොරොත්තුව ය. එහෙත් එහි දී එහි සිංහල බෞද්ධකම නැතිකළ යුතු නො වේ.

ඇතැමුන්ට අනුව සිංහලයන්ට අවුරුද්ද ලැබී ඇත්තේ දෙමළ ජනයාගෙනි. එහි දී නායක්කාර වඩිග රජුන්ගේ නම කියැවෙයි. නායක්කාර රජු දවස සිංහලයන් අවුරුදු උත්සවය දෙමළ (අඩුම තරමින් හින්දු) ජනයාගෙන් ලබාගත්තේ යැයි කීමට මෙහි දී උත්සාහ ගැනෙයි. එහෙත් මෙරට දෙමළ ජනයාගෙන් කී දෙනෙක් අවුරුදු උත්සවය බක් මහේ සමරත් ද? එසේ සැමරුවත් එය සිංහලයන්ගේ මෙන් නැකැත් උත්සවයක් කරගෙන තිබේ ද? තමිල්නාඩුවේ මෙ සමයේ අවුරුද්දක් ඇරඹෙයි ද? ඊනියා සටන් විරාම ගිවිසුම අත්සන් කළ අවධියෙහි ම පේරාදෙණි විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ කිහිප දෙනෙක් බක් මහේ දී යාපනයට ගොස් එහි අවුරුදු චාරිත්‍ර ගැන විමසා බැලූහ. ඔවුන්ට දැනගන්නට ලැබුනේ යාපනයේ සිංහලයන්ගේ මෙන් බක් මහේ අවුරුද්දක් නැති බව ය. දෙමළ හින්දු ජනයාගේ අවුරුද්ද ලබන්නේ තෛපොංගල් දිනයේ දී ය.  එදින, එනම් දළ වශයෙන් ජනවාරි දහහතර වැනි දින සූර්යයාගේ මකර සංක්‍රාන්තිය සිදුවෙයි. සූර්යයා එදින ධනු රාශියෙන් මකර රාශියට පිවිසෙයි. මෙහි යම්කිසි අරුතක් නැතිවා නො වෙයි. පෘථිවියට සාපේක්ෂව සූර්යයා අවුරුද පතා (ක්‍රාන්ති වලයය දිගේ) යන ගමනෙහි දකුණට ගොස් උතුරට හැරෙන්නේ දෙසැම්බර් මස විසිඑක්වැනි දා ය. පැරණි මිසරයන්ගේ අවුරුද්ද ඇරඹුනේ දෙසැම්බර් විසිපස්වැනි දාය. ඒ මිත්‍ර දෙවියාගේ නමින් ය. මිත්‍ර දෙව් නමින් වුව ද එහි දී වැදගත් වුයේ සූර්යයා දකුණට ගොස් උතුරට හැරීම ය. කතෝලික සංස්කෘතිය විසින් මේ දිනය ක්‍රිස්තුස්වහන්සේගේ උපන් දිනය බවට පත්කෙරිණි. ඉන් සතියකට පසුව ජනවාරි පළමුවැනි දා ලකුණු කෙරිණි. තෛපොංගල් දිනය අද වන විට ජනවාරි දහහතර වැනි දා පවත්වනු ලැබුව ද අවුරුදු දෙදහසකට පමණ පෙර ඒ දිනය දෙසැම්බර් විසිඑක්වැනි දින (නිවැරදිව කියන්නේ නම් දෙසැම්බර් විසිඑකට අනුරූප දිනයක - අද බටහිර භාවිතා කෙරෙන ග්‍රෙගරියානු දින දර්ශනය එකල නො වී ය) පවත්වනු ලැබී යැයි විශ්වාස කළ හැකි ය. ඒ දිනය ඉදිරියට ගොස් ඇත්තේ පෘථිවිය තම අක්ෂය වටා භ්‍රමණය වන අතර පෘථිවි අක්ෂය ද අවකාශයෙහි වෙනත් අක්ෂයක් වටා භ්‍රමණය වන බැවිනි. ග්‍රෙගරියානු දින දර්ශනයට සාපේක්ෂව එය අවුරුදු හැත්තෑතුනකට පමණ එක් දිනයක් ඉදිරියට යයි. මෙවැන්නක් බක් මහේ අවුරුද්ද සම්බන්ධයෙන් ද සිදුවෙයි.  සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට යෑම අවුරුදු දෙදහසකට පමණ පෙර සිදුවුයේ  මාර්තු මස විසිඑක්වැනි දා ය. අද එය අප්‍රියෙල් මස දහහතර වැනි දා සිදුවෙයි. ටික කලෙකින් ඒ සිදුවනු ඇත්තේ අප්‍රියෙල් මස පහළොස්වැනි දා ය. රොබට් නොක්ස් මෙහි සිටි අවධියෙහි ඒ සිදුවුයේ අප්‍රියෙල් අට නවය වැනි දිනවල ය. ඔහු මාර්තු මස අග දී ඒ සිදුවිණි යැයි කියන්නේ එවකට බ්‍රිතානීන් යොදාගත් ජුලියානු දින දර්ශනය අනුව ය. ග්‍රෙගරියානු දින දර්ශනයට අනුව ඒ දින අප්‍රියෙල් මස අට නවය වෙයි. මේ පිළිබඳ විස්තරයක් සිංහල අවුරුද්ද නමින් පළ වී ඇති පොතෙහි සඳහන් ය. ගමන්කරන්නේ පෘථිවිය මිස සූර්යයා නොවේ යැයි කියන හේතුවාදියකුට හෝ භෞතිකවාදියකුට හෝ වෙනත් පුස්සකුට හෝ මැට්ටකුට හෝ අවශ්‍ය නම් වික්‍රමබාහු කරුණාරත්න හෝ වෙනත් එවැන්නකු හෝ සමග සංවාදයක් සංවිධානය කළ හැකි ය.

© Prof. Nalin De Silva

ඒ කෙසේ වෙතත් බක් මහේ අවුරුද්ද සිංහල සංස්කෘතියට ඇතුල්වූයේ කවදා ද කෙසේ ද යන්න පිළිබඳ ව ප්‍රශ්න වෙයි. ඒ අවුරුද්ද කාගෙන් සිංහලයනට ලැබුණත් ඔවුන් ඒ ලබාගෙන ඇත්තේ සිංහල බෞද්ධ සංස්කෘතියක බව, එනම් ඒ සංස්කෘතියට සාපේක්ෂව බව පැහැදිලි ය. පුණ්‍යකාලය, නොනගතය ආදිය වෙනත් සංස්කෘතියක ඒ අයුරින් දක්නට නො හැකි ය. ඉන් පිළිබිඹු වන්නේ (පැරණි) සිංහලයාගේ නිර්මාණශීලීත්වය ය. කලින් සඳහන් කළ පරිදි අවුරුද්ද සිංහලයන් ලබාගත්තේ දෙමළ හින්දු ජනයාගෙන් විය නොහැක්කේ ඔවුන් එදින සමරන අවුරුද්දක් නැති බැවිනි. අද ලංකාවේ දෙමළ හින්දු ජනයා එදින යම් උත්සවයක් පවත්වන්නේ නම් ඒ සිංහලයන්ගෙන් ලැබෙන ආභාසය හේතුවෙනි. එහි වරදක් නැත. වරද ඇත්තේ කණපිට හැරවීමෙහි ය.

බක් මහේ අවුරුද්ද ගැන කියැවෙන පළමු තැන ගඩලාදෙණි සෙල්ලිපිය නම් ඉන් කියැවෙන්නේ අවුරුද්ද ඇරඹුනේ එකල බව නො වෙයි. එකල ද අවුරුද්ද සැමරූ බව පමණක් ඉන් කියැවෙයි. එහි ආරම්භය එයට පෙර විය හැකි ය. මෙරට නැකැත් කෙළි ගැන කියැවෙන්නේ බොහෝ කලක සිට ය. පණ්ඩුවාස රජතුමාගේ කාලයෙහි ද නැකැත් කෙළි තිබූ බව කියැවෙයි. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කෙළේ ද මෙරට වැසියන් නැකැත් කෙළි පැවැත් වූ පොසොන් දිනයක ය. බක් මහ අවුරුද්ද ද නැකැත් කෙළියකි. අපට සලකා බැලීමට සිදුවන්නේ පොසොන් ආදී නැකැත් කෙළි වෙනුවට ශක වර්ෂයේ උදාව නැකැත් කෙළියක් බවට පත්වූයේ කෙසේ ද කවදා ද යන්න ය. ඉතා පැහැදිලිව ම ශක වර්ෂයේ උදාව සැමරිය හැක්කේ ශක වර්ෂය ආරම්භයෙන් පසුව ය. මෙය ශක රාජ වංශය සමග සම්බන්ධ ය. ශකයන් ගැන කතාකිරීමේ දී ශාතවාහන වංශිකයන් ගැන කතා නොකර සිටීමට නො හැකි ය. ශක වර්ෂයේ ආරම්භය ගැන කියැවෙන විට ශාලිවාහන වංශය ගැන ද කියැවෙයි. මේ රජවරු නැගෙනහිර ඩෙකැන් ප්‍රදේශයෙහි, එනම් වත්මන් ආන්ද්‍ර ප්‍රදේශයෙහි රජකළ බෞද්ධ රජවරු වූහ.

අද තමිල්නාඩුවේ බෞද්ධකමක් ගැන කතාකිරීමට සිංහලයන්ගේ උරුමය නැතිකිරීමට අවශ්‍යවූවනට ද ඔවුන් විසින් මෙහෙයවනු ලබන ඇතැමුනට ද තදියමක් තිබුණ ද ද්‍රවිඩ ගෝත්‍රිකයන්ගෙන් බෞද්ධ වූවෝ ආන්ද්‍රයෝ ය. එකල ථෙරවාදී මධ්‍යස්ථාන වූයේ ආන්ද්‍ර ප්‍රදේශය හා ලංකාව ය. ආන්ද්‍රයන් හා සිංහලයන් අතර වූ සම්බන්ධකම් ඉතා සමීප විය. ආන්ද්‍රයේ අට්ඨකතා ගැන අපි දනිමු. එහි සිහළ විහාරයක් විය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට වැඩම කෙළේ ද ආන්ද්‍ර ප්‍රදේශයෙනි. එකල එනම් පස්වැනි සියවසෙහි පමණ ආන්ද්‍රයෙහි ථෙරවාදී බුදු සසුන හා සමස්තයක් ලෙස බුදු සසුන පිරිහීම ඇරඹී තිබුණි. ලංකාවේ ථෙරවාදී බුදු සසුන ආරක්ෂාකිරීමට මහාවිහාරික භික්ෂූන්වහන්සේ නොයෙකුත් පියවර ගත්තේ ආන්ද්‍රයේ එකල පැවති තත්වය ගැන කල්පනා කිරීමෙන් පසුව යැයි සිතිය හැකි ය. බුදුගොස් හිමියන් මෙරටට වැඩම කර සිංහල ග්‍රන්ථ පාලියට පරිවර්තනය කෙළේ ද එහි එක් පියවරක් වශයෙන් යැයි සිතමු.

අද ලෝකයේ බක් මහේ උත්සව පවත්වන ප්‍රධාන රටවල් වනුයේ මියන්මාරය, තායිලන්තය, කාම්බෝජය වැනි ථෙරවාදී රටවල් ය. චීනයේ ද ථෙරවාදී ප්‍රදේශයක මේ උත්සවය පැවැත්වෙන බව මේ සම්බන්ධ අධ්‍යයනයක යෙදෙන වරුණ චන්ද්‍රකීර්ති මහතා පවසයි. එහෙත් ලංකාව හැර අනෙක් ථෙරවාදී බෞද්ධ රටවල නැකැත් කෙළියක ස්වරූපයෙන් ඒ නො පැවැත්තෙවයි. බක් මහ අවුරුද්ද හින්දු උත්සවයක් නොව බෞද්ධ, වඩාත් නිරවුල් ව කියන්නේ නම් ථෙරවාද බෞද්ධ උත්සවයක් යැයි කිව හැකි ය. භාරතීය හින්දු රාමුවෙන් කැඩී කලාපීය බෞද්ධ රාමුවේ ඉතිහාසය දකින්නේ නම් අපට අපේ වර්තමානය ගැන මෙයට වඩා පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි වනු ඇත.

අලුත් අවුරුද්ද ගැන පමණක් නොව මෙරට ඉතිහාසය, මහාවිහාරයේ කාර්යභාරය, පැරණි සිංහලයන්ගේ නිර්මාණශීලීත්වය, පසුව ඒ නිර්මාණශීලී බව නැතිවීම ආදිය ගැන අධ්‍යයනය කිරීමට තවත් බොහෝ  කරුණු වෙයි. තමන් බලන ආකාරය අනුව කරුණු ද වෙනස්වන බව අමතක නොකළ යුතු ය. ඒ කෙසේ වෙතත් දැනට තිබෙන කරුණු අනුව කිව හැක්කේ බක් මහ අවුරුද්ද හෙවත් ශක වර්ෂ උදාව ආන්ද්‍රයෙන් ථෙරවාද බෞද්ධ සම්බන්ධතා හේතුවෙන් ලැබී මෙරට ආදි කාලයේ සිට තිබූ නැකැත් කෙළි සමග මිශ්‍ර කර සිංහල බෞද්ධයන් අළුත් අවුරුද්දක් නිර්මාණය කර ඇති බව ය. වඩුගයන්ගේ සම්භවය ද ආන්ද්‍රයේ බව මෙහි දී සඳහන් කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva